සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

**2024**

**3**

නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන

# "අදිති"

## II පත්‍රය

පැය 01 යි

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

01. පහත දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.

සිසිර ඉසුඹුවට පසු සිසුහු පාසල වෙත පැමිණියහ. විස්මිත දෙයක් දක්නට ලැබී ඔවුහු සතුටෙන් කෑ ගසන්නට වූහ. පන්ති කාමර මැදිරි පෙළට විරුද්ධ පැත්තෙන් රැස්වීම් හල අසල මල් පාත්ති පසු පස, නව මැදිරිය නැඟී සිටියේ ය. ඔවුන් නො සිටි දිනවල එය පොත් ගුලක් බවට පෙරළී තිබිණ. සියලු ම දෙනා ගරු කළ, හැම වැඩක් ම කිරීමට සමත් මුරකරු වූ රියෝ'චං බොහෝ වෙහෙස මහන්සි වී වැඩ කර තිබිණි. පොත් රාක්ක විශාල ගණනක් සවි කොට, සියලු ම වර්ගවල වර්ණවත් පොත් පේළිවලින් ඒවා පුරවා තිබිණ. හිඳ ගෙන කියැවීම සඳහා පුටු සහ මේස තබා තිබිණි.

- **ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

   i. ඡේදයේ සඳහන් සිසුහු සතුටින් කෑ ගැසුවේ කුමක් නිසා ද?

   ..........................................................................................................................................

   ii. "විවේකයට" යන්නට ඡේදයේ සඳහන් ව ඇති වචනයක් ලියන්න.

   ..........................................................................................................................................

   iii. ඡේදයේ සඳහන් මුරකරු ගේ නම කුමක් ද?

   ..........................................................................................................................................

   iv. ඡේදයේ සඳහන් යුගල පදයක් ලියන්න.

   ..........................................................................................................................................

   v. "මහප්‍රාණ" අකුරක් සහිත වචනයක් තෝරා ලියන්න.

   ..........................................................................................................................................

   vi. "අලුත්" යන වචනයට ගැළපෙන සමානාර්ථ පදයක් ඡේදයෙන් උපුටාගෙන ලියන්න.

   ..........................................................................................................................................

02. පහත වාක්‍ය බහු වචනයට හරවා නැවත ලියන්න.

   i. ගිරවා අඹ කෑවේ ය.

   ..........................................................................................................................................

   ii. වෛද්‍යවරයා රෝගය පිළිබඳ දැන සිටියේ ය.

   ..........................................................................................................................................

03. පහත යෙදුම්වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළු ලියන්න.

   i. සෑම විටම තමන් සමග තවත් අයෙක් එකට සිටීම.

   ..........................................................................................................................................

   ii. දුක් මහන්සියෙන් කළ වැඩක කිසිදු ප්‍රතිඵලයක් නොලැබීම.

   ..........................................................................................................................................

04. පහත වාක්‍යවලට ගැළපෙන විරාම ලකුණු යොදන්න.

   i. ප්‍රස්තාව පිරුළු කියන්නේ මොනවා ද සීයේ

   ii. ඇය එන්නේ කරඹ කොහුකිරිල්ල ගෙඩි කඩා ගෙන ය

05. ප්‍රාණවාචී බහුවචන ස්ත්‍රී ලිංග නාම පදය තෝරා ලියන්න.

   කුරුල්ලා / තාරකාවෝ / ගිරවා / ගෙවිලියෝ - .............................................

06. ද්‍රව්‍ය නාම පදයක් නොවන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

පැන්සල, කේතලය, කාමරය,කෝට්ටුව

07. පහත වචනවල වැරදියට ලියා ඇති අකුර නිවැරදි කර නැවත ලියන්න.

i. සළකුණ - ........................................

ii. පිළියෙළ - ........................................

08. මිශ්‍ර සිංහල හෝඩිය ඇසුරෙන් දී ඇති අක්ෂරය තෝරා ඉදිරියෙන් ලියන්න.

i. මහාප්‍රාණ අක්ෂරයකි. .................................. (ශ, ඵ, ළු)

ii. අල්පප්‍රාණ අක්ෂරයකි. .................................. (ප, ධ, ණ)


iii. අවරෝහණ අක්ෂරයකි. .................................. (ව, ද, න )

09. "හඩයි" යන වචනය "නැත" යන අර්ථය හැඟවන සේ ලියන්න.

..........................................................................................................................................

10. "අශ්වයෙක්" යන පදයෙහි අනුක්ත පදය ලියන්න. ........................................

11. පහත රූපවලට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

 ................................  ................................

12. පහත වචන අතරින් නොගැළපෙන ඉංග්‍රීසි වචනය තෝරා හිස්තැන මත ලියන්න.

i. dog / cat / cow / table - ......................................................

ii. car / rose / van / lorry - ......................................................

13. පහත ඉංග්‍රීසි වාක්‍යයට අදාළ සිංහල තේරුම ලියන්න.

i. Happy new year - ......................................................

ii. Look at the stars - ......................................................

14. පහත දෙමළ වචනවලට අදාළ සිංහල තේරුම ලියන්න.

i. සන්දෙ - ......................................................

ii. කළුවුංගල් - ......................................................

15. පහත වාක්‍යයේ තේරුම සිංහල අකුරින් ලියන්න.

උංගල් අණ්නා යාර් - ......................................................

(ලකුණු 1 x 30 = 30)

- **පිළිතුරු ලියන්න.**

16. පහත දී ඇති සංඛ්‍යාව විහිදුවා ලියා ඇත. එහි හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව ලියන්න.

5080 ⟶ 5000 + ............. + 80 + 0

17. අකුරින් ලියා ඇති සංඛ්‍යාවට දෙකක් එකතු කර ඉලක්කමෙන් ලියන්න.

අටදහස් දෙසිය දහ නවය - .......................................................

18. පහත දී ඇති සංඛ්‍යා සියල්ල අවරෝහණ පටිපාටියට සකස් කර තිත් ඉරි මත ලියන්න.

| | |
|---|---|
| **1309** | **2178** |
| **2175** | **4311** |


....................... ....................... ....................... .......................

19. රාක්කයක ඉංග්‍රීසි පොත් 205 ක් ද, සිංහල පොත් 978 ක් ද තිබුණි.


i. රාක්කය තුළ තිබුණු මුළු පොත් ගණන කීය ද? .............................................

ii. ඉංග්‍රීසි පොත්වලට වඩා සිංහල පොත් කීයක් තිබුණේ ද? .............................................

20. ගසකින් කඩන ලද දොඩම් ගෙඩි ප්‍රමාණයක් පහත දැක්වේ. ඒවායින් 2/4 ක් ඉදී ඇත. ඉදී ඇති දොඩම් ගෙඩි ගණන පාට කරන්න.



21.




**පෙ.ව. 10.40**

i. ඔරලෝසුවේ දැක්වෙන වේලාවට පැය තුනකට පසු වේලාව ලියන්න. ......................................

ii. ඔරලෝසුවෙන් දැක්වෙන වේලාවට පාඩම කියවා අවසන් කළ බිනිති පැය 1 මිනිත්තු 25ක් ඒ සඳහා ගත කළා ය. ඇය පාඩම කියවීම ආරම්භ කළ වේලාව පැය 24 ඔරලෝසුවෙන් ලියන්න.

................................................................ (ලකුණු 2 x 2 = 4)

22. වෙළෙඳ සැලකින් කුඩයක් මිල දී ගෙන ඒ සඳහා රුපියල් 1000 ක නෝට්ටුවකින් මුදල් ගෙවූ අයෙකුගෙන් තවත් රුපියල් 28 ක් ඉල්ලා ගෙන ඉතුරු මුදල ලෙස රුපියල් 450 ක් දුන්නේ ය. කුඩයේ මිල කීය ද?


..........................................................................................................................................

23. 56mක් දිග ලණුවක් සමාන කැබලි 7 කට කපන ලදී. එක් කැබැල්ලක දිග කොපමණ ද?

..........................................................................................................................................

24. ජලය පුරවා ඇති ටැංකියකින් මිනිත්තුවකට ජලය ලීටරයක් බැගින් කාන්දු වෙයි. පැයකට පසු එහි තිබූ ජලය ප්‍රමාණය 440 / කි. ටැංකියෙහි පැයකට පෙර තිබූ ජලය ප්‍රමාණය කොපමණ ද?

..........................................................................................................................................

25. 


නගරය සැලැස්මක් රූපයෙහි දැක්වේ.


A සිට ගමන ආරම්භ කළ සරත් E හරහා D වෙත පැමිණියේ ය. A සිට ගමන ආරම්භ කල සුනෙත් B හරහා C වෙත පැමිණියේ ය.

i. වැඩි දුරක් ගමන් කළේ කවුද? ........................................................

ii. දෙදෙනා දැන් සිටින ස්ථානය අනුව ඔවුන් දෙදෙනාට හමුවීම සඳහා ගෙවිය යුතු දුර කොපමණ ද? ............................................

26. 125 g ක් බර සබන් කැට 9 ක් ඇති මල්ලක බර ග්රෑම් හා කිලෝ ග්‍රෑම්වලින් දක්වන්න.

..............................................

27. 

i. රූපයෙහි පාට කළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. ...............................................

ii.පාට කළ කොටස සහ පාට නොකළ කොටු අතර වෙනස කීය ද? .......................................

(ලකුණු 2 x 2 = 4)

28. අයියාගේ වයස අක්කාගේ වයස මෙන් දෙගුණයකි. අක්කාගේ වයස අවුරුදු 11 කි. අයියාගේ වයස අවුරුදු කීය ද? ............................................

29. පැයක් තුළ පාරේ ගමන් කළ වාහන පිළිබඳව තොරතුරු පහත දැක්වේ. ඒ ඇසුරෙන් වගුවෙහි හිස්තැන් පුරවන්න.

| වාහන වර්ගය | වාර ගණන | එකතුව |
|---|---|---|
| යතුරු පැදි | ///// ///// /// | ................. |
| ලොරි | ///// / | 6 |
| බස් | | ................. |
| කාර් | ///// ///// ///// | ................. |

i. ගමන් කළ යතුරු පැදි ගණන කීය ද?

..............................................

ii. ලොරි මෙන් දෙගුණයකට දෙකක් වැඩියෙන් බස් රථ පාරේ ගමන් කළේ ය. එම ප්‍රමාණය නිවැරදිව වගුවේ සඳහන් කරන්න.

(ලකුණු - 16 - 29 = 32)

- ප්‍රශ්න අංක 30 සිට 59 තෙක් ප්‍රශ්වලට නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

30. ශ්‍රී ලංකාවේ ඒක දේශික ශාකයකි,

i. තේක්ක ii. කොස් iii. ආරිද්ද

31. වඩාත් ඉක්මනින් පැළයක් බවට පත් වන බීජය කුමක් ද?

i. මිරිස් iii. බණ්ඩක්

ii. අබ කා

32. පැළයක් ලබා ගැනීමට දඬු යොදා ගන්නා ශාකය කුමක් ද?

i. රාබු ii.මඤ්ඤොක්කා iii. බීට්රූට්

33. ශාක කොටස් පමණක් ආහාරයට ගන්නා පක්ෂියෙකි.

i. සමනලයා ii. පැණි කුරුල්ලා iii. දෙමළිච්චා

34. අපිරිසිදු ජලය පානය කිරීම නිසා හානි වන ශරීර අවයවය කුමක් ද?

i. වකුගඩු
ii. ආමාශය
iii. කුඩා බඩවැල්

35. කුඹුරු ආශ්‍රිත ජලය ශරීරයේ තුවාලවල ගෑවීම මගින් පැතිරෙන රෝගයකි.

i. අතීසාරය ii. මී උණ iii. කොළරාව

36. ශක්තිජනක කාණ්ඩයට අයත් ආහාරය කුමක් ද?

i. කිරි ii. නිවිති iii. දෙල්


37. අඳින ලද චිත්‍ර නිසා ශ්‍රී ලංකාවේ පිහිටි ලෝකප්‍රකට ස්ථානය කුමක් ද?

i. ඇම්බැක්කේ දේවාලය ii. පොළොන්නරුව iii. සීගිරිය

38. බඕබැබ් ගස පිහිටි ප්‍රදේශය කුමක් ද?

i. ඕපනායක ii. පේරාදෙනිය iii. මන්නාරම

39. කොළ වර්ණය මිශ්‍ර කරගත් අයිස් කැට කිහිපයක් විනිවිද පෙනෙන වීදුරුවකට දමා ස්වල්ප වේලාවකට පසු වීදුරුවෙහි පිටත පැත්තේ ජල බිඳු කිහිපයක් ගත හැකි විය. එම ජල බිඳු සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.



i. ජල බිඳු අයිස් කැටයේ වර්ණයෙන්ම තිබුණි.
ii. ජල බිඳු අයිස් කැටයේ වර්ණයට වඩා ලා වර්ණයෙන් තිබුණි.
iii. ජල බිඳු අවර්ණව තිබුණි.

40. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනයේ සශ්‍රීකත්වය හා ස්වයංපෝෂිත බව දැක්වීමට යොදා ගත් සංකේතය කුමක් ද?

i. ඉර හා හඳ ii. වී කරල් iii. පුන් කලස

41. ජලයේ පාවෙන, ගිලෙන, ජලය උරා ගන්නා අවස්ථා නිවැරදිව දැක්වෙන ලෙස යොදා ගන්නා දේ පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. ලී කුට්ටිය, වීදුරු බෝතලය, ඇල්පෙනෙත්ත
ii. ඇල්පෙනෙත්ත, ලී කුට්ටිය, වීදුරු බෝලය
iii. කඩදාසි, වීදුරු බෝලය, රෙදි කැබැල්ල

42. ත්‍රිකුණාමලය, මුතූර් අසලින් මුහුදට එක් වන ගංගාව කුමක් ද?

i. මහවැලි ගඟ ii. නිල්වලා ගඟ iii. මල්වතු ගඟ

43. ගෙමැස්සා මගින් රෝග බීජ ශරීර ගත වීමෙන් වැලදෙන රෝගයකි,

i. චිකුන්ගුන්යා ii. මැලේරියා iii. පාචනය

44. ගෙම්බා සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.

i. බිත්තරයකින් බිහි වේ. ජීවන චක්‍රයක් සහිතයි.


ii. පැටවකු ලෙස බිහි වී දිය ගොඩ වාසය කරයි.
iii. හමෙන් හුස්ම ගැනීම කරයි. පිහිනීමට හා කිමිදීමට හැකියි.

45. ආහාර විෂ වීමක දී ඇති වන රෝග ලක්ෂණයක් නොවන්නේ,
i. තොල් ඉදිමීම. iii. ක්ලාන්තය
ii. අධික බඩගින්න

46. නියමිත වේලාවට ආහාර නොගැනීමෙන් හා තෙල් අධික ආහාර ගැනීම නිසා ඇති වන රෝග තත්ත්වයකි,
i. අම්ල පිත්ත රෝගය iii. පාචන
ii. දියවැඩියාව

47. විටමින් C බහුල ආහාර අඩංගු පිළිතුර වන්නේ,
i. ගොටුකොළ, මුකුණුවැන්න iii. කිරි, බිත්තර
ii. දෙහි, අන්නාසි

48. කප්පි යොදා වැඩ පහසු කර ගැනීමේ දී බරක් ඉහළට එසවීමට ගන්නා උත්සාහය නිවැරදිව දැක්වෙන රූපය තෝරන්න.





49. ඩෙංගු රෝගය වැලැක්වීමට වඩාත් ම සුදුසු ක්‍රියාමාර්ගය කුමක් ද?
i. හැකි සෑම විටම මදුරු දැල් භාවිතය.
ii. නිතර පරිසරය පිරිසිදු කර අනවශ්‍ය ජලය රැස්වන තැන් ඉවත් කිරීම.
iii. කජු ලෙලි දුම්, මදුරුතලා දුම් ආදිය යොදා මදුරුවන් පලවා හැරීම.

50. පන්තියේ ශිෂ්‍යයෙකු කළ හොඳ වැඩක් පන්තියේ අන් අය ඉදිරියේ අගය කිරීම,
i. යුතුකමකි. ii. අයිතිවාසිකමකි iii. නීතියකි

51. බස් රථයක ගමන් කරන අයෙක් වැඩිහිටි අයෙකුට තම ආසනය පරිත්‍යාග කිරීම,
i. යුතුකමකි. ii. අයිතිවාසිකමකි. iii. වගකීමකි.

52. රජයේ පාසලකින් නොමිලේ අධ්‍යාපනය ලැබීම සෑම ශිෂ්‍යයෙකු ම සතු,
i. යුතුකමකි. ii. අයිතිවාසිකමකි iii. වගකීමකි

53.  රූපයේ දැක්වෙන ශ්‍රී ලංකා නිදහස් සටනට උර දී ක්‍රියා කළ ජන නායකයා වන්නේ,

i. සිද්ධි ලෙබ්බේ මහතා
ii. ආරුමුගනාවලර් මහතා
iii. අනගාරික ධර්මපාල තුමා

54. නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස විරුදාවලි ලබා ඇති ශ්‍රී ලංකා නිදහස් අධ්‍යාපන සටනේ වීරවරයා වන්නේ,

i. ඩී.එස්. සේනානායක මහතා
ii. අනගාරික ධර්මපාල තුමා
iii. සී.ඩබ්.ඩබ්. කන්නංගර මහතා

55. කන්තලේ හා ගිරිතලේ වැව් නිර්මාණය කිරීමට පුරෝගාමී වූ රජතුමා කවුරුන් ද?

i. මහසෙන් රජතුමා
ii. දෙවන අග්බෝ රජතුමා
iii. මහා පරාක්‍රමබාහු රජතුමා

56. "කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා" යන ජන කවිය අයත් ජන කවි වර්ගය තෝරන්න.

i. පතල් කවි
ii. ගැල් කවි
iii. පාරු කවි

57. චුම්භකයකට ඇදී එන ද්‍රව්‍ය යුගලය කුමක් ද?

i. ඉදිකටු, ඇලුමිනියම් කැබලි
ii. අල්පෙනෙති, යකඩ ඇණ.
iii. යකඩ කුඩු, වීදුරු කැබලි

58. ජලයේ වඩාත් ඉක්මණින් දිය වන දේ තෝරන්න.

i. ලුණු
ii. පොල් තෙල්
iii. මැටි

59. නිල් හා රතු වර්ණ මිශ්‍ර කළ විට ලැබෙන වර්ණය කුමක් ද?

i. දම්
ii. කොළ
iii. තැඹිලි

(ලකුණු - 1 x 30 = 30)

60. "**අප විසින් පිළිපැදිය යුතු යහපත් සෞඛ්‍ය පුරුදු**" යන මාතෘකාව යටතේ උක්ත ආඛ්‍යාතය නිවැරදි වැකි තුනක් ලියන්න. ඔබ ලියන වැකියක වචන හයක්වත් අවම වශයෙන් තිබිය යුතු අතර, අක්ෂර වින්‍යාසය සහ පිල්ලම් භාවිතය නිවැරදි විය යුතුය.

i. ........................................................................................................................
ii. ........................................................................................................................
iii. ........................................................................................................................
iv. ........................................................................................................................
v. ........................................................................................................................

(ලකුණු - 2 x 3 = 6)

(සමස්ත ප්‍රශ්න පත්‍රයේ පැහැදිලි බව හා පිරිසිදුබව සලකා ලකුණු දෙකක් පිරිනමන්න.)